

# මනෝ... මහන්සිද? විවේක අරං ආපහු එන්න...

බුද්ධදාස ගලප්පත්ති

අප දන්නා පරිදි දවසකට ඇත්තේ හෝරා විසි හතරකි. එහෙත් ජයලත් මනෝරත්නගේ දවසකට හෝරා කොතෙක් වේදැයි මට සිතා ගන්නට නොහැකිය. ඈත දුර බැහැර නගරයක, ගම් දනව්වක ගුරු තරුව හෝ අන්දරේලා, තල මල පිපිලා හෝ හඬ නිහඬ රංගනයකට,එසේත් නැත්නම් ටෙලි නාට්‍යයක චිත්‍රපටයක රූ ගත කිරීමකට සහභාගී වී පසු දා අලුයම නිවසට පැමිණියත් ඔහුට සුවබර නින්දකට ඉඩක් ලැබුණේ නම් ඒ ඉතා කලාතුරකිනි. පසු දා උදෑසනින් ම යළිත් ඔහුගේ දවස ඇරැ විශ්වවිද්‍යාලයක බාහිර කථිකාචාර්යවරයාගේ භූමිකාව නිම කරනා මනෝට හවස් යාමයේ මිතුරකුගේ පොත පත දොරට වැඩුමක දේශනයකි. ඉන් අනතුරුව සහෝදර නාට්‍යකරුවකුගේ නාට්‍යයක ප්‍රථම දර්ශනයකි. ඉන් අනතුරුව සමීප මිතුරකුගේ නිවසෙහි පැවැත්වෙන සංගීත සාදයකි. මිතුරකුගේ දරුවකුගේ විවාහ මංගල්‍යයයක්, උපන් දින සැමරීමක් වෙනුවෙන් පවැත්වෙන උත්සවයකි. මේ සියලු තැන්හි මනෝ සිටී. ඒ සියලූ තැන්හී වීරයා වන්නේ මනෝය. නාට්‍යය ප්‍රේක්ෂකාගාරයක, විද්වත් සභාවක, විශ්වවිද්‍යාල ශිෂ්‍ය ගණයා අතර හිතවතුන් මැද, ඔවුන්ගේ දූ පුතුන් සමග මනෝ ජීවත් වූයේය. එබඳු දවස් කොපමණක් පිළිබඳ, කොපමණ මතක මා සතුව තිබේ දැයි මම ම නොදනිමි. එහෙත් එය සැබෑවකි.

මනෝ තම දිවි සැරිය නිමා කළේ අදට සති දෙකකට පෙර ඉරිදා උදෑසනකය. ජනවාරි 12 වැනි දා අලුයම් කාලයේය. අද අපට මනෝගේ රුව නො පෙනේ. කටහඬ නො ඇසේ. ම විසින් ඉහත සඳහන් කළ එකදු තැනක දී හෝ දැන් අපට මනෝ හමු නොවේ. දවසේ පැය විසිහතර පැය හතළිස් අටක් හෝ ඊටත් වඩා වැඩි කාලයක් සේ සලකමින් තම මෙහෙවර ඉටුකරන කලාකරුවා, සිය ඇමතුමකින්, රැඟුමකින්, ගැයුමකින් සුවහසක් රසික ජනයාගේ මන කොඳ පුබුදු කළ තීර්ථ යාත්‍රිකයා, හඬ නිහඬ අතර ගත කළ වසර එකහමාරක පමණ කාල පරාසයක් පිළිබඳ සංක්ෂිප්ත අතීතාවර්ජනයකි මෙම සටහන. ආචාර්ය ජයලත් මනෝරත්න, රසිකයන්ගේ ආදරණීය මනෝගේ ජීවිතය, ඔහුගේ නාට්‍ය, සාහිත්‍ය, සිනමා කලා සම්ප්‍රදාය පිළිබඳ හෝ ඔහුගේ ජීවන තතු, පවුලේ තොරතුරු පිළිබඳ හෝ යළි යළිත් සිහිපත් කිරීමට මම අදහස් නොකරමි. පසුගිය සති දෙක තුළ ඔහු පිළිබඳ, ඔහුගේ ජීවිතය පිළිබඳ කතා නොකළ, නොලියවුණු, විකාශය නොකළ එකදු ගුවන් විදුලියක්, මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයක්, සමාජ මාධ්‍ය ජාලාවක් නොමැති තරම්ය. ඔහු එවැනි ප්‍රචාරයක්, ආවරණයක් ලැබීමට සෑම අතකින්ම සුදුස්සකු වූයේය. පණ්ඩිත් අමරදේව හෝ ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් වැන්නකුට හැර එවන් මාධ්‍ය ආවරණයක් ලද මෑත කාලයේ වියෝ වූ කලාකරුවකු පිළිබඳ මතකයක් මා සතුව නොමැත. එච්.ආර්.ජෝතිපාලගේ වියෝව, ආචාර්ය සරත් අමුණුගම විසින් එදා හැඳින් වූ ජනප්‍රිය සංස්කෘතික කුලූනක් බිඳ වැටීමක් වී නම් එහි ප්‍රබුද්ධ අනුවාදය ජයලත් මනෝරත්න සතු වී යැයි මට සිතුණි. ඔහු මිය ගිය ඉරිදා සිට බොරලැස්ගමුව සුසානභූමියේ දී පසළොස්වක බදාදා සැඳෑ යාමයේ චිතකයෙන් නැඟි දුම් රොටුව හිස් අහසට එකතු වූ මොහොත තෙක් ඔහුට බුහුමන් පුදන්නට, ඔහුට ආදරය ප්‍රකාශ කරන්නට දිවයිනේ නන් දෙසින් පැමිණි විවිධ තරාතිරම් හි ජනී ජනයා, දූ දරුවන් , තරුණ තරුණියන්, සහෝදර කලාකරුවන්, බොරලැස්ගමුව අබේරත්න මාවත, රතනාරාම පාර අසල්වාසීන් ගේ ආදරය කෙතරම් විශාල වීද යන කාරණාව මට එසේ සිතන්නට මුල් වූ ප්‍රධාන සාධක වීය. සතියක් පුරා සියලූ ජන මාධ්‍ය ඔස්සේ මනෝ කවුරුන් දැයි ලොවම දැන ගත් මුත්, ඔහුගේ ජීවිතයේ අවසාන භාගය ඔහු කෙසේ ගත කළා දැයි දන්නෝ විරලය. එබැවින් ඒ කාල සමයේ මා දුටු, මා හා සමීප මිතුරන්ට හමු වූ මනෝ පිළිබඳ අතීතාවර්ජන අත්දැකීම් සටහනක් ලෙස මෙය ලියා තබන්නෙමි.

නිෂ්පාදක වෝල්ටර් අබේසුන්දර හා අධ්‍යක්ෂ සුසිරන් ද සිල්වාගේ ''මිස් ජෙනී'' චිත්‍රපටයේ රූ ගත කිරීම් නිමා කොට මිස් ජෙනී බවට පත් වූ මනෝගේ නිශ්චල ඡායාරූප සිනමා පුවත්පත් හා සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වන්නට පටන් ගත්තේ කවදා එම චිත්‍රපටය දකින්නට ලැබේ දෝයි යන කුතුහලය ප්‍රේක්ෂක මනසෙහි ජනිත කරවමිනි. 2018 නොවැම්බරයේ දී මනෝ තේජා ඉද්දමල්ගොඩගේ ''ආශාවරී'' චිත්‍රපටයේ රූගත කිරීම්වල යෙදී සිටියේ දියතලාවේ ය. එහි දී එක්වරම ඔහුට ඔහුගේ සිරුරින් විලවුන් සුවඳක් ආඝ්‍රාණය වන්නට පටන්ගත් පසු ඔහු රූ ගත කිරීම් නවතා කොළඹ පැමිණෙන්නේය.
මනෝ ඇතුළු අපගේ නාට්‍ය හා මිත්‍ර සමාගමයෙහි බොහෝ සාමාජික සාමාජිකාවන්ගේ පවුලේ වෛද්‍යවරුන් සේ කාලයක් තිස්සේ ප්‍රතිකාර කරනු ලබන වෛද්‍ය ජගත් හා යුද හමුදා රෝහලෙහි බ්‍රිගේඩියර්, වෛද්‍ය නිමල්කා ආරියරත්න (තරුණ පොප් ගායක මිහිඳු ආරියරත්නගේ දෙමාපියන්) හමු වූ පසු රෝගය පිළිබඳ තතු වටහා ගන්නට නිමල්කාට කාලයක් අවශ්‍ය නොවිණ. ඈ විසින් මනෝ වහාම යොමු කරනු ලැබූයේ ස්නායු පිළිබඳ විශේෂඥ වෛද්‍ය මහාචාර්ය සමන් ගුණතිලක වෙතටය. ඔහු හමුවීමෙන් අනතුරුව මනෝට ශල්‍ය කර්මයක් කිරීම අවශ්‍ය වූ බැවින් ක්ෂණිකව ආසිරි සෙන්ට්‍රල් රෝහලේදී මනෝව ශල්‍ය කර්මයකට භාජනය කරනු ලැබීය. හෝරා හතරකට වඩා වැඩි කාලයක් ගත වූ සාර්ථක ශල්‍යකර්මයට වැයවූ සම්පූර්ණ වෛද්‍ය හා රෝහල් ගාස්තුව ගෙවන ලද්දේ ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතාගේ මැදිහත්වීමෙන්, ජනාධිපති අරමුදල හා සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් බව කිව යුතුය. දැන් මනෝගේ ජීවිතයට සැනසුම් සුසුමක් එක් වී හමාරය. මනෝ කෙමෙන් සුවපත් වෙමින් සිටි අතර ඔහු අතින් ඉටු කරනට නොහැකි කටයුතු හා වගකීම් පිළිබඳ ඔහු කනස්සල්ලෙන් පසු වූ බව දනිමු. සිරුරට යන්තම් පණක් ලද සැණින් ඔහු ආශාවරී චිත්‍රපටයේ ඉතිරි රූ ගත කිරීම් අවසන් කොට අධ්‍යක්ෂවරයා ගේ බර සැහැල්ලූ කළේය.

මනෝ යළි පෙර පුරුදු මනෝ බවට පත්වෙමින් සිටී. කැනඩාවේ සිට පුත්‍ර සමාගම ෂරාෆ්නෝව් ගේ පුතු අජිත් ජිනදාස මෙරට ආ ඉසිඹුවක 80 කණ්ඩායම සමග මනෝ රාත්‍රි භෝජන සංග්‍රහයකට සහභාගී වී මිත්‍ර සමාගම සමග සතුට බෙදා ගත්තේය. ඔහුගේ අවසාන නිර්මාණය, ''හඬ නිහඬ රැඟුමකට'' බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන රංග භූමියේ දී සහභාගී වෙමින් ඔහුට ආදරය කළ රසික සමූහයා මුණ ගැසිණ. රසිකයෝ සුවපත් වූ මනෝ දැකගන්නට ඔහු හා කතාබහ කරන්නට රොක් වූහ. ජූනි 12 වැනි දා මනෝගේ උපන් දිනයයි. දෝහා කටාර්හි දී සුද්දෙක් ඔබ අමතයි දර්ශනයක් සංවිධාන කොට තිබුණේ කලකට පෙර වූවත්, මනෝගේ කාර්ය බහුලත්වය නිසා හා රෝගී තත්ත්වයන් නිසා කිහිප වතාවක් ම කල් දමා තිබිණ. මෙවර එම රංගනය කෙසේ හෝ කළ යුතුය යන අදිටනින් යුතුව වෛද්‍ය උපදෙස් ලබා ගෙන දෝහා කටාර් සුද්දෙක් ඔබ අමතයි දර්ශනයට සහභාගී වෙමින් තම උපන් දිනය ද එහි දී සැමරුවේය.
මිතුරන්ගේ ඉල්ලීමක් වෙනුවෙන් වූ පොරොන්දුවක් මනෝ අතින් බිඳෙන්නේ කලාතුරකිනි. ජර්මනියේ ප්‍රිස්බර්ග් හි වෙසෙන ඔහුගේ පාසල් මිතුරා, පොරමඩුල්ල මැදි විදුහලේ මිතුරා, අමරසිරි ගුණවර්ධන, කලාකරුවන්ගේ මිත්‍ර සමාගම ප්‍රිය කළ සහෘදයෙකි. ඔහුගේ සමීප මිතුරකු වූ ආචාර්ය ධර්මසේන පතිරාජ ගේ වියෝවින් පසු ඈත දුෂ්කර ගම්මානයක පාසලක් සඳහා ඔහුගේ ධන පරිත්‍යාග යෙන් පතී නමින් පාසල් ගොඩනැඟිල්ලක් තනවා තිබිණ. එහි විවෘත කිරීමේ උළෙලට මනෝගේ සහභාගීත්වය අවශ්‍ය වන බව කලින්ම මනෝට දන්වා තිබිණ. දෝහාකටාර් චාරිකාව නිම කොට පැමිණ අනෙක් අතට මනෝ මිතුරාගේ ඉල්ලීම ඉටු කිරීමට මරදන්කඩවලට එහා පදවිය ගම්මානයේ ධර්මසේන පතිරාජ නමින් ඉදි කළ පාසල් ගොඩනැඟිල්ල විවෘත කිරීමට සහභාගී වී පසු දා අලූයම නිවසට පැමිණියේ සුපුරුදු සුවයෙන් නොවේ.

ජූලි මාසයේ දී යළි රෝහල් ගතවන මනෝ පසුව මහරගම අපේක්ෂා රෝහලේ

25 වන පිටට